


කුරුසිය





ශුද්ධ බයිබලය




දෙව් මැදුර

# 1 අපි දේව මැවිලි වෙමු




පුංචි දිවි රැක ගනිමු
දෙවිඳුන්ට තුති පුදමු

# 2 වටිනා දේව දීමනා



අව්ව වැස්ස පොළොව අපට
දුන් දෙවිඳුට පුදමු තුති.

# 3 මනහර දේව දීමනා



මේ ලස්සන ගස් වැල් මල්
දුන් දෙවිඳුට තුති පැසසුම්

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (1)හි ඇත.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

# 4 අපි දෙමව්පියන්ට ආදරය කරමු



දෙවිඳුන් දුන් මව්පියන්ට ආදරෙයි අපි
උදවු කරමු උදවු කරමු ආදරෙන් අපි

5

# අපි සහෝදර සහෝදරියන්ට ආදරය කරමු




අක්කයි අයියයි - නංගියි මල්ලියි

එකතුව දෙවිඳුට - පුදමු තුති



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

# 6 අපේ නෑදෑ හිතමිතුරන්




නෑදෑ හිත මිතුරන් අපට ලබාදුන් දෙවිපියාට ස්තුතියි.

# 7 අපේ ආදර ගුරු මව්පියන්

ආදර දෙව්ඳුනි,

අපට ලබා දුන්
ගුරුවරු සැම ගැන
පුදමුව ඔබට තුති.
ආමෙන්.





උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (2)හි ඇත.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

# 8 පුංචි මමත් හොඳ ළමයෙක්




දෙව් දරුවකු වන්නට මම
කරනෙමි හොඳ වැඩ සැම දින

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (3)හි ඇත.

# 9 දේවදූත පණිවුඩය




මරියතුමිය දේව හඬට කීකරු වූවා සේ
අපිත් දේව හඬට කීකරු වෙමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (4)හි ඇත.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

# 10 ජේසුස් වහන්සේ ඉපදුණා



බෙත්ලෙහෙමේ ගව මඩුවේ - අප ජේසුස් බිළිඳා
රෙදි ඔතලා එහි බාවා - ගව ඔරුවේ සිටිනා
තරු අහසේ දිළිසෙමිනේ - එතුමා දෙස බැලුවේ
අප ස්වාමි බිළිඳා වී - නිදි කරවා සිටියේ

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (5)හි ඇත.

# 11 ජේසුස් වහන්සේ නමදිමු




ලකුණක් වී දුර අහසේ තාරකාව බැබලුණා
බෙත්ලෙහෙමේ ගවමඩුවේ ගැළවුම්කරු ඉපදුණා
රෑ යාමේ එඬේර කැළ බිළිඳු ජේසු නමදිනා
ශාස්ත්‍රවන්තයන් පඬුරු පුදා නමැද පිටවුණා
අපිත් ජේසුස් වහන්සේ නමදිමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (6)හි ඇත.

12

# පුදුම හාස්කමක්



රොටී පහයි මාළු දෙකයි - පොඩිත්තෙක් අතේ
තිබී එදා දුන්නා ජේසු - අතට සන්තොසේ
ආශිර්වාද කළාට පසු - කෑලි කඩාලා
පන්දහසක් දෙනාගේ - කුස ගින්න නිවාලා

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (7)හි ඇත.

# 13 යැදුම් පුදමු අපි මෙලෙසින

ජේසුස් වහන්සේ හැම විට ම දෙවි පියාණන් වහන්සේට කතා කළාක් මෙන්, පුංචි අපිත් සැම විට ම යාච්ඤා කරමු.




උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (8)හි ඇත.

# 14 ශුද්ධාත්මයාණන් වහන්සේ



ශුද්ධාත්මයාණෝ ලෝ (වැඩ වසයි) //
ශුද්ධාත්මයාණෝ ලෝ වැඩ වසයි
මා තුළත් වැඩ වසයි.


# 15 අපි සමගියෙන් සිටිමු




වාද බේද දුරලමු
සැමදෙනා ම එක් වෙමු
සතුටු සිනා නංවමු
සමගියෙ බල පතුරමු.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

# 16 අප සතු දෑ බෙදා ගනිමු



සඳුනි : මගේ වයලීනය කැඩුණා.

ගුරුතුමිය : අඬන්න එපා, අපි හදාගන්න බලමු.

හිරන්ත : මේ මගේ වයලීනය, ඒකෙන් පුරුදු වෙන්න.

සඳුනි : ඔයාට ස්තූතියි.

ගුරුතුමිය : බොහොම හොඳයි හිරන්ත. මේ වගේ ම සමාරිතයා තමාට ඇති දේ වැටී සිටි මිනිසා සමග බෙදාගත් ආකාරය ඔයාලට මතක ඇතිනේ?

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (9)හි ඇත.

# 17 ආදරයෙන් රැකබලා ගනිමු



අන්තර්ජාලය ඇසුරින්

බේද නොතකා
සැම දෙනාට සේවය කරමු.
යහපත් සමාරිතයා
අනුගමනය කරමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (10)හි ඇත.

# 18 දෙවිඳුන් පසසන හොඳ දරුවෝ



දාවිත් කුඩා බැටළු එඬේරෙක්. දාවිත්ගේ තාත්තාට බැටළුවන් ගොඩක් සිටියා. දාවිත් බැටළුවන් තණ පිට්ටනිවලට ගෙන ගියා. කුඩා දාවිත් අත වීණාවක් තිබුණා.

බැටළුවන් බලා ගන්නා සෑම විට ම දාවිත් ලස්සනට වීණාව වාදනය කරමින් දෙවිඳුන්ට ප්‍රශංසා කළා.

පුංචි අපිත් වාදනයෙන් හා ගායනයෙන් දෙවි පියාණන් වහන්සේට ප්‍රශංසා කරමු.

# 19 සුවය දෙන ජේසුස් වහන්සේ



ගලීලයේ කානා නම් ගමේ රජයට සේවය කරන නිලධාරියෙක් සිටියා. දවසක් ඔහුගේ පුතා අසනීප වුණා.

ජේසුස් වහන්සේ රෝගීන් සුවපත් කරන බව නිලධාරියා අසා තිබුණා.

"උතුමාණෙනි, මගේ පුතා මරණාසන්න ව සිටිනවා. ඔහුව සුව කරන්න ඔබ තුමාට පුළුවන්" නිලධාරියා ජේසුස් වහන්සේට කිවුවා.

"යන්න, ඔබේ පුතා ජීවත් වේ" යයි ජේසුස් වහන්සේ පැවසුවා. නිළධාරියා එය විශ්වාස කළා. දරුවා සුවපත් වුණා.

අපිත් හැම විට ම විශ්වාසයෙන් දෙවිපියාණන්ට යාච්ඤා කරමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක (11)හි ඇත.

# 20 මරණය පරදා ජයගත් ජේසුස් වහන්සේ

ජේසුස් වහන්සේ මා නිසා කුරුසියේ දිවි පිදුවා.




උන්වහන්සේ මරණය පරදා නැවත නැගිට්ටා. හාලේලූයියා! පැසසුම් වේවා!



ක්‍රි

යා

කා

ර

ක

ම්


ඇමුණුම් අංක 1

ගෙඩි, කොළ, හා මල් පාට කඩදාසිවලින් කපා අලවා ගස අලංකාර කරන්න.



අංකවලට අදාළ පාට යොදා මල් පොකුර පාට කරන්න.

1 කහ පාට
2 රතු පාට
3 දම් පාට
4 රෝස පාට
5 නැටි - දුඹුරු පාට
6 රිබන් පටි -තැඹිලි පාට
7 කොළ - කොළ පාට



ඇමුණුම් අංක 3

ඔබේ
රූපය මෙහි
අඳින්න.

| | |
|---|---|
| 1. උදෑසනින් අවදි වීම | |
| 2. යාච්ඤා කිරීම | |
| 3. අන් අයට උදව් කිරීම | |
| 4. හොඳ වචන කථා කිරීම | |
| 5. සතුන්ට ආදරය කිරීම | |
| 6. පාඩම් කිරීම | |
| 7. දිනපතා පාසලට පැමිණීම | |


ඔබ කරන හොඳ වැඩ ඉදිරියෙන් තරු අලවන්න.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඇමුණුම් අංක 4

වර්ණ තුනක පාට පැන්සල් භාවිත කරමින් පාට කරන්න.



ඇමුණුම් අංක 5

අවසාන පිටුවෙහි ඇති පින්තූර කපා අංක පිළිවෙළට මෙහි අලවන්න. පින්තූරය කුමක් ද?


| | |
|---|---|
| 1 | 2 |
| 3 | 4 |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඇමුණුම් අංක 6


පඬිවරයාට ගවලෙනට යා හැකි පාර රතු පාටින් අඳින්න.
එඬේරාට ගවලෙනට යා හැකි පාර නිල් පාටින් අඳින්න.



රොටී පහ සහ මසුන් දෙදෙනා පාට කොළවල කපා අලවන්න.



යාච්ඤා කරන අවස්ථා නිවැරදි ව ගළපා යා කරන්න.



ඔබ සතු දෑ අන් අය සමග බෙදා ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න. පාට කරන්න.

පාට පැන්සල් භාවිත කරමින් තිත් ඉරි මත ලියන්න.


මම

යහපත්


සමාජිකයෙක්

වෙම්

චිත්‍රය පාට කරන්න.



4



3



2



1

